# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/30 - 2022 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2003

**2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත**

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය, 8 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (3) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු එම පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2022 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2002 ඔක්තෝබර් මස 20 වැනි දින අංක 2302/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. එහි 2 වන නියෝගයේ (1) වන අනුනියෝගයේ "මෙහි 1 වන උපලේඛනයෙහි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව නියම කරනු ලබන සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ කාර්යය සඳහා මෙහි 1 වන උපලේඛනයෙහි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

2. එහි 1 වන උපලේඛනයේ III වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කිරීමෙන් :-

1A - PG 6105 — 706 (2022/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

" IV කොටස

*තෝරා ගැනීමේ සීමාව ගණනය කිරීම*

ශ්‍රී ලංකාවේ දුප්පත් පුද්ගලයන් විසිරී ඇති ආකාරයට අනුරූපව දැනට තිබෙන වැඩසටහන් අයවැය බෙදා හැරීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ලකුණු සීමාව දිස්ත්‍රික් මට්ටමින් තීරණය කරනු ලැබේ. එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන වෙනම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ලකුණු සීමාව තීරණය කරනු ලැබේ.

ජාතික මට්ටමින් වැඩසටහන සඳහා තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව Q නම් i දිස්ත්‍රික්කය සඳහා වන ප්‍රතිලාභීන් සංඛයාව (qi) පහත දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ ;

$$X = \frac{\text{රට තුළ සුබසාධක ගෙවීම් ලැබිය යුතු පවුල් සංඛ්‍යාව}}{\text{රට තුළ සිටින මුළු පවුල් සංඛ්‍යාව}}$$

(qi)= දිස්ත්‍රික්කයේ ජාතික මට්ටමින් ඒක පුද්ගල මූර්ථ වියදමේ ප්‍රතිශතය x වන අගයට අඩුවෙන් ඇති පවුල් සංඛ්‍යාව

එවිට

$$Q = \sum_{i=1}^{25} qi$$

i = 1, 2, 3 ...................... 25 (දිස්ත්‍රික්ක).".

EOG 12 - 0166